# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
# Assignment for Vacation -2020
## ව්‍යාපාර අධ්‍යයනය

**Lesson 01**

නම / අංකය .................................................. **12 ශ්‍රේණිය**

01. පාසල් ළමුන්ට පාවහන් ලබාගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය මගින් නව චක්‍රලේඛයක් නිකුත් කිරීම අරඹා ඇත.මින් උදාවූ වෙළඳපොළ අවස්ථාවෙන් ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා අල්විස් මහතා විසින් කල්පවතින මිල අඩු සපත්තු නිෂ්පාදනය කොට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.
මේ සඳහා වෙළඳපොළ තුළ නිර්මාණය වූ ඉහළ ඉල්ලුම නිසා දිස්ත්‍රික්කය පුරා තම නිෂ්පාදනය බෙදා හරින ලද අතර එමෙන්ම තමා ආරම්භ කරන ලද වෙළඳසැල් තුළ ද මෙය අලෙවියට තබා ඇත. එමෙන්ම ප්‍රදේශයේ ජනසෙත යහසාධක සංගමය ද තම අරමුදල් යොදවා අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට නොමිලේ පොත්පත් සැපයීමේ කටයුත්තක් ද නව පාසල් වාරය තුළ අරඹා ඇත.
    i. ඉහත සිද්ධියේ සඳහන් අල්විස් මහතාගේ ව්‍යාපාරය ඇතුළත් කොට ව්‍යාපාර සඳහා නිර්වචනයක් ඉදිරිපත් කරන්න.
    ii. ජනසෙත සුභසාධක සංගමය මගින් සිදුකරනුයේ ව්‍යාපාර කටයුත්තක්ද? යන්න පිළිබඳ ඔබගේ අදහස දක්වන්න.
    iii. ඉහත සිද්ධියේ සියලු කටයුතු ඇතුළත්වන පරිදි ව්‍යාපාර සම්බන්ධ නිර්වචනයක් ඉදිරිපත් කරන්න.
    iv. ඉහත සිද්ධියේ සඳහන් අල්විස් මහතා සහ ජනසෙත සුභසාධන සංගමය මගින් තෘප්තිමත් කරන මිනිස් අවශ්‍යතාවයන් නම් කරන්න. ඒවා අවශ්‍යතාවයක් ලෙස සැලකීමට හේතු සඳහන් කරන්න.
    v. වුවමනාවල දැකියහැකි ලක්ෂණ 4 ක් සඳහන් කරන්න
    vi. ඉහත සිද්ධිය ඇසුරින් තොග වෙළෙඳාම සඳහා මෙන්ම සිල්ලර වෙළඳාම සඳහා උදාහරණ දක්වන්න.

02. අ.පො.ස. [ සා.පෙ.] දක්වා ඉගෙනගත් නිර්මලා ඇයගේ මව සමග ආහාර පිළියෙළ කොට එය පැකට් කර උදේ ආහාර පැකට්ටුවක් රු.70/= බැගින්ද දහවල් ආහාර පැකට්ටුවක් රු.100/= බැගින්ද නගරයේ වැඩබිම් කිහිපයකට මෙන්ම ආපනශාලා කිහිපයකට නිර්මලාගේ පියා විසින් තම පා පැදියෙන් රැගෙන ගොස් අලෙවි කරයි.
මිළ අඩුවීමත්, වැඩබිම තුළට රැගෙන ඒමත්, ප්‍රමාණවත් ප්‍රනීත ආහාර තිබීමත් කෘතීම රසකාරක අඩංගු නොවීමත් යන කාරනා මත නිර්මලාගේ බත් පැකට් අලෙවිය සීග්‍ර ලෙස ඉහළගිය අතර ඊට අනුකූලව සැපයුම ද ඉහළ නංවන ලදී.
මෙහිදී නිර්මලාගේ ලාභයද ඉහළ ගිය අතර තම ව්‍යාපාරය පුළුල්කිරීම සඳහා පාපැදියට අමතරව ත්‍රිවිලරයක් මිළට ගත් අතර සේවිකාවන් දෙදෙනෙකුද බඳවා ගන්නා ලදී.
බත් පැකට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සහල්, එළවළු ඇතුලු අනෙකුත් සියලුම ද්‍රව්‍ය නගරයේ මෙන්ම තම ගමේ සැපයුම්කරුවන්ගෙන් තොග වශයෙන් අත්පිට මුදලට මෙන්ම ණයට මිළදී ගන්නා ලද අතර එම ගනුදෙනුවල පහසුව සඳහා ජංගම ගිණුමක් ද අරඹන ලදී.
මේ අතරතුර වෙළඳ පොළේ නිර්මාණය වූ නව තරඟය නිසා ඊට මුහුණ දීමට ඇය එකිනෙකට වෙනස් වර්ගයේ බත් පැකට් කිහිපයක් විවිධ මිළ ගණන් යටතේ වෙළඳපොළට ඉදිරිපත් කරන ලදී. මෙයට පාරිභෝගිකයින්ගේ දැඩි කැමැත්තක් හිමි වූ අතර අලෙවියද වැඩි විය.
මෙම කරුණු මත ඇයට භාහිර පාර්ශවයන් සමග යහපත් ව්‍යාපාරික සබඳතා රැසක් ගොඩනගාගත හැකි වූ අතර එමගින් ව්‍යාපාරික අත්දැකීම් රැසක් ද ලබාගත හැකි විය. ඒ අනුව ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් ස්වයං අභිප්‍රේරණයක් ඇය තුළ සිදු විය.
    i. ව්‍යාපාර වල දැකිය හැකි ගති ලක්ෂණ 7ක් නම් කොට මෙම සිද්ධිය ඇසුරින් ඊට උදාහරණ දෙන්න.
    ii. ව්‍යාපාරයක විවිධ අරමුණු තිබිය හැක. මෙම සිද්ධිය ඇසුරින් එවැනි අරමුණු 4ක් සඳහන් කරන්න.
    iii. නිර්මලාට වෙළඳ පොළක් තුළ ලඟා කරගත හැකි වෙනත් ව්‍යාපාර අවස්ථා තිබේද? ඒවා නම් කරන්න.
    iv. නිර්මලාට අනාගයේදී පැනගිය හැකි තර්ජන මොනවාදැයි දක්වන්න.
    v. නිර්මලා තම රටේ ආර්ථික සංවර්ධනයට දායක නොවේ මෙය සත්‍ය ද අසත්‍යද යන්න දක්වා එය පැහැදිලි කරන්න.

03. ව්‍යාපාරයක් උපයන ලාභය යන්නෙහි රුපියල් ශත වලින් ලබන ලාභයට වඩා වැඩි යමක් ඇත. මෙය පැහැදිලි කරන්න.

04. ව්‍යාපාරිකයෙකු උපයන ලාභයට අමතරව ඔහුට අභිප්‍රේරණය විය හැකි වෙනත් අවස්ථා මොනවාදැයි නම් කරන්න.

05. ව්‍යාපාර නිරන්තරයෙන් අවදානම් වලට මුහුණ දේ ඒ අනුව ව්‍යාපාරයකට ප්‍රායෝගිකව පාලනය කළ නොහැකි අවදානම් මොනවාදැයි දක්වන්න.

06. ව්‍යාපාරිකයෙකුට වෙළඳ පොලක් තුළ වුවමනා නිර්මාණය කළ හැක්කේ අමුද්‍රව්‍ය නිමි භාණ්ඩ බවට පත් කිරීමෙන් පමණි. මෙය සත්‍යයද අසත්‍යද යන්න දක්වන්න.

07. පාරිභෝගිකයෙකු ලෙස ඔබ පරිභෝජනය කරන සියලුම දෑ වක්‍ර නිෂ්පාදන වේ.මෙම ප්‍රකාශනයට ඔබ එකඟ වන්නේදැයි යන්න දක්වා පැහැදිලි කරන්න.

08. ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථාවක් වනුයේ කාර්මික විප්ලවයයි. යුරෝපීය රටවල ඇති වූ මෙම කාර්මික ප්‍රබෝධය නිසා නිෂ්පාදන ක්ෂේත්‍රයේ සහ වානිජ ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් 4 බැගින් සඳහන් කරන්න.

09. ඔබගේ එදිනෙදා කටයුතු වලදී විද්‍යුත් වානිජ්‍ය භාවිතා වන අවස්ථා 3 ක් සඳහා නිදසුන් දක්වන්න.

10. ඉන්දියාවෙන් පොතක් ගෙන්වා ගැනීමට සූදානම් වූ කමල් ඉන්දියාවේ සිටින අපනයන කරුට එම ගණුදෙනුවේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවීම් කිරීමට සූදානම් වූ පසු ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. එම වටිනාකම් ඇමරිකානු ඩොලර් වලින් ගෙවන ලෙසට ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. එම විටිනාකම් ඇමරිකානු ඩොලර් වලින් ගෙවන ලෙසට ඔහු විසින් කමල්ට දන්වන ලදි.

i. මෙම ගණුදෙනුවේදි ශ්‍රී ලංකා රුපියල් ප්‍රතික්ෂේප කිරිමට බලපාන ලද කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. ඔහු එම ගණුදෙනුව වටිනාකම් ඉන්දියන් රුපියල්වලින් ඉල්ලා නොසිටිමට හේතු පැහැදිලි කරන්න.

11. එදිනෙදා ජීවිතයේදී මෙන්ම ව්‍යාපාර කටයුතුවලදී විද්‍යුත් වානිජ්‍යය භාවිතාවන අවස්ථා වැඩිදියුණු වී ඇත. මෙයට බලපාන ලද හේතු සඳහන් කරන්න.

12. ව්‍යාපාර ක්‍රියාවලිය රූප සටහනක් මගින් දක්වන්න.

13. පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතනයක් විසින් භාවිතා කරන යෙදවුම් කිහිපයකි. එම යෙදවුම් භූමිය, ශ්‍රමය , ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය තොරතුරු දැනුම, කාලය යටතේ වර්ග කර දක්වන්න.

- ❖ අමුද්‍රව්‍ය පිළිබඳ දත්ත එක් රැස් කිරීම.
- ❖ කළමනාකරුවන්ගේ වෙහෙස
- ❖ ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම
- ❖ සම්පත් සංකලනය පිළිබඳ තීරණ ගන්නා
- ❖ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම
- ❖ තීරණ ගැනීම සඳහා වේ ලබා ගැනීම
- ❖ මුරකරුගේ මහන්සිය
- ❖ ගොඩනැගිල්ල
- ❖ නීති උපදෙස් සැපයීම
- ❖ වෙළඳ පොළ පිළිබඳ විස්තර
- ❖ සේවකයින් වැඩකරන ශ්‍රම පැය ගණන
- ❖ හිරු එළිය

14. පහත දැක්වෙන්නේ ව්‍යාපාර කාරයයන් සඳහා නිදසුන් කීපයකි. ඒවා ව්‍යාපාර කාර්යයන් යටතේ වර්ග කර දක්වන්න.

- තොග පාලනය
- වැටුප් ගෙවීම
- සේවක ලිපි ගොනු සැකසීම
- බෙදා හැරීමේ කටයුතු
- අනුස්ථාපනය
- තොරතුරු පද්ධති පවත්වාගෙන යාම
- නිෂ්පාදනය වැඩි දියුණු කිරීම
- කළමනාකරුවන්ට උපදෙස් සැපයීම
- වට්ටම් ලබා දීම
- කොටස් නිකුත් කිරීම
- සේවකයින් උසස් කිරීම
- පිරිවැය අඩුක්‍රම අධ්‍යයනය
- තොරතුරු යාවත්කාලීන කිරීම
- තත්ව පාලනය
- සේවක රාජකාරී ලයිස්තු සැකසීම්

15. ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන් නම් කරන්න.

16. ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් කෙරෙහි ව්‍යාපාරවල අවධානය යොමුවන කරුණු සඳහන් කරන්න.

17. ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන සියලු පාර්ශවයන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම එම ව්‍යාපාරයේ ගණුදෙණු කරුවන් මත රඳා පවතී. මෙය පැහැදිලි කරන්න.

18. ඇමරිකා එක්සත් ජනපදය හා ජපානය පාරිභෝගිකයා නිර්වචනය කොට ඇත්තේ "පාරිභෝගිකයා යනු රජෙකි. පාරිභොගිකයා යනු දෙවියෙකි" යනුවෙනි. ඒ තරමටම පාරිභෝගිකයා ව්‍යාපාරයකට වැදගත් වන කරුණු 3 ක් නම් කරන්න.

19. ව්‍යාපාරයක් තුළ සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් හා තත්වයන් වෙන වෙනම නම් කරන්න.

20. මලිත් ලියාපදිංචි සර්වාංග ආයුර්වේද වෛද්‍යවරයෙකි. ඒ සම්බන්ධ ඔහුට උපාධියක් ද ඇත. ඔහුගේ පියාද දක්ෂ ආයුර්වේද වෛද්‍යවරයෙකි. නගරයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යන මලිත් එම ප්‍රදේශයේ ජනතාව අතරද ප්‍රසිද්ධය.

එමෙන්ම තම ගණුදෙනුකරුවන්ට සියලුම වර්ගයේ ආයුර්වේද ඖෂධ සැපයීමේ ව්‍යාපාරයක්ද පවත්වාගෙන යයි.

මෑතකදී කොරෝනා වෛරසය රට තුළ පැතිරයාමත් සමගම උද්ගතවූ තත්වය තුළ දියුණු පාරම්පරික බෙහෙත් වට්ටෝරුවකට අනුව ජනතාවගේ ප්‍රතිශක්තිකරණය වැඩිදියුණු කිරීමේ ඖෂධයක් නිෂ්පාදනට කොට බෙදාහැරීම අරඹන ලදී. ව්‍යාජ වෙළෙඳුන් හා වෛද්‍යවරුන් මෙම අවස්ථාවේ වෙළඳපොලට පිවිසෙන නිසා ඔහු අදාල බලයලත් ආයතන වලින් ලිඛිත අවසරය හා ලියාපදිංචියද මෙම නව ඖෂධය සඳහා ලබා ගන්නා ලදී. එහි ප්‍රතිඵලය වූයේ ඔහුගේ මෙම ඖෂධයේ අලෙවිය සීඝ්‍රලෙස ඉහළයාමයි.

i. නව ඖෂධ නිපදවා අලෙවියේදී අභ්‍යන්තර පරිසරය සාධකයක් වන සම්පත් තුළින් ශක්තීන් නිර්මානය කර ගැනීම සඳහා මොහු අවධානය යොමුකළ යුතු කරුණු සඳහන් කරන්න.
ii. ඉහත සිද්ධියට අනුව මලිත් මහතා සතුව ඇති ශක්තීන් 4 ක් නම් කරන්න.
iii. ඉහත සිද්ධියට අනුව වෙළඳපොළ තුළ උදාකරගත හැකි වෙනත් ව්‍යාපාර අවස්ථා දෙකක් සඳහන් කරන්න.
iv. ඉහත සිද්ධියට අනුව මලිත් මහතා සිල්ලර මෙන්ම තොග වෙළඳාමේ යෙදෙන්නේද යන්න දක්වා ඊට හේතු පැහැදිලි කරන්න.

21. ව්‍යාපාරයේ සාර්ව පරිසරයේ ප්‍රධාන බලවේග සඳහන් කර ඒවාට ඇතුලත් වන උප සාධක වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

22. සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි විවිධ බලපෑම් ඇති කරයි. එවැනි ඕනෑම සාර්ව පරිසර බලවේග 4 ක් ගෙන ඉන් ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් සඳහා නිදසුන බැගින් ඉදිරිපත් කරන්න.

23. ව්‍යාපාර කටයුතු කිරීමේදී ව්‍යාපාරවලට සාර්ව පරිසර බලවේග එකක්නොව කිහිපයක බලපෑම් එල්ලවි හැක.

   i. මෙයට බලපාන ලද හේතුව සඳහන් කරන්න.
   ii. මෙය සනාථ කිරීම සඳහා නිදසුන් දෙකක් දක්වන්න.

24.

   i. රාජ්‍ය අංශයේ සේවක වැටුප් 10% කින් වැඩි කෙරේ.
   ii. රට තුළ ළමා ජනගහනය ඉහළ යාම.
   iii. ශ්‍රී ලංකාවත් චීනයත් අතර වෙළඳ ගිවිසුමක් ගොඩනැගීම එමගින් ශ්‍රී ලංකාවෙන් චීනයට කරන අපනයන සඳහා තීරුබදු සහනයක් ලබා දීම.
   ඉහත සිද්ධීන් අයත් වන සාර්ව පරිසර බලවේග නම් කොට එමගින් ව්‍යාපාර ක්ෂේත්‍රයට සිදුවන බලපෑම සඳහන් කරන්න.

25. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට අනුව ව්‍යාපාර වර්ග කොට දක්වන්න.

26. ව්‍යාපාර නව ප්‍රවනතාවයන් රැසක් බිහිවීමට බලපාන ලද ප්‍රධාන කාරණයක් වූයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවයි. මේ අනුව එසේ සිදුවූ නව ප්‍රවනතා මොනවාද යන්න දක්වන්න.

27. ඇ.එ.ජ. , චීනය, රුසියාව වැනි රටවල ස්වයංපෝෂිත ආර්ථිකයක් දැකිය හැක. මෙය සත්‍යයද අසත්‍යයද යන්න දක්වන්න.

28. පහත සඳහන් සිද්ධීන් සඳහා අදාලවන ව්‍යාපාර ගති ලක්ෂණය නම් කරන්න.

   i. අස්වැන්න ලැබෙන කාලවලදී එය රැස්කර තබාගෙන හිඟ කාලවලදී බෙදා හැරීම.
   ii. සාලිය හිඟ සම්පත් භාවිතා කොට ලී බඩු නිෂ්පාදනය කොට බෙදා හැරීම
   iii. කමලා විසින් සෑම දිනකම කොළ කැඳ පිළියෙළ කොට කොළ කැඳ වීදුරුවක් රුපි. 20/- බැගින් විකිණීම
   iv. සීමාසහිත හෙළදිව සමාගමේ 2019 ගිණුම් කාලපරිච්ඡේදයේ අවසානයේදී අදායමට වඩා වියදම ඉහළයාම.
   v. නිමල් යතුරු පැදි විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
   vi. සමන් 2019 වර්ෂය අවසානයේදී ප්‍රමාණවත් ලාභයක් උපයාතිබීම මෙන්ම එමගින් පරිසරය සුරැකීමේ කටයුතු සඳහා දායක වීම වෙනුවෙන් තෘප්තිමත්වීම.

29. විද්‍යුත් වානිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යන්න විස්තර කරන්න.

30. ව්‍යාපාර කාර්යයන් අතරේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ව්‍යාපාරයකට ඉතා වැදගත් වේ. මෙය පැහැදිලි කරන්න.

31. භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේදී යොදාගන්නා සම්පත් වල ස්වරූපය වෙනස් කරමින් එහි අගය වැඩි කිරීම. ............................................................ ලෙස හැඳින්වේ.

32. අවශ්‍යතාවයන්ට සාපේක්ෂව සම්පත් අසීමිතව පැවති ආර්ථිකය ................................................ ලෙස හැඳින් වේ.

33. සෘජු නිෂ්පාදන වල ආරම්භය ..................... ................................. තුළ සිදු විය.

34. විශේෂිකරණයෙහි ආරම්භය සඳහා පදනම වූයේ ............................................යි

35. පුද්ගල විශේෂිකරණයේ ප්‍රතිඵලය ලෙස ............................................ ඇති විය.

36. භාණ්ඩ හුවමාරුව ආරම්භ වූයේ .........................................................සමගිනි.

37. ............................................ මෙන්ම ............................................. ආරම්භය භාණ්ඩ හුවමාරුව සමග සිදු විය.

38. පසුකාලීනව භාවිතා වන අච්චුකාසිවලට පදනම වූයේ ....................................යි.

39. ව්‍යාපාර විකාශනයේ තුනවන අදියර වූයේ ....................................................යි.

40. වානිජ්‍යය .................................. හා ........................................... එකතුවකි.

41.නිෂ්පාදනයේ ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කරනුයේ ....................................., ......................................... හා ................................ යනුවෙනි.

42.ව්‍යාපාරවලට අවශ්‍ය අරමුදල් සම්පාදනය හා යෙදවීම සම්බන්ධ කටයුතු .............................................. යටතට ගැනේ.

43. ව්‍යාපාර කාර්යයන් අතුරින් ව්‍යාපාරයකට අදාළ ලියකියවිලි හා සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම .................................................. යටතට ගැනේ.

44. ව්‍යාපාරවලට බලපෑම් කරන සුවිශේෂී සංවිධාන හෝ කණ්ඩායම් ........................................... ලෙස හැඳින්වෙන අතර එසේ බලපෑම් කරන පුළුල් වටපිටාව හා කණ්ඩායම් .......................................... ලෙස හැඳින්වේ.

45.ව්‍යාපාරයට බලපෑම් කරන ව්‍යාපාර ආයතනයට පිටතින් ඇති සියලුම දේ ............................................. ලෙස හැඳින්වේ.

46. ව්‍යාපාරයේ අරමුණ ළඟා කරගැනීමට පහසුවන පරිදි එහි කටයුතු , සම්පත් , අධිකාරිය බෙදී යන ආකාරය දක්වනුයේ ......................................... මගිනි.

47. ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීමට සිදු කරන කාර්යයන් .............................................. ලෙස හඳුන්වයි.

48. වාණිජ්‍යය බොහෝ දුරට සමාන කළ හැකිවන්නේ ........................................ යි.

49. ව්‍යාපාරයක් පදනම් කරගනිමින් ........................................... නිර්මාණය කරයි.

50. ව්‍යාපාරයකට වැදගත්වන්නේ...........................නොව ............................... යි.

51.වෙළඳපොළ විශාලවීමක් ලෙස සලකන්නේ ....................................... යුතු ජනගහනයේ වර්ධනයක් නම් පමණි.

52.යන්ත්‍ර උපකරණ හා නිෂ්පාදන තාක්ෂණය වෙනස්වීම නිසා ව්‍යාපාරවලට .................................................. දැකිය හැක.

53. ඔබ ගමේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයෙකු නම් ඔබගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් අතුරින් ඔබගේ ව්‍යාපාරයට බලපෑම් කිරීමට ඇති හැකියාව මත ඔබට වැඩි වැදගත් කමක් ඇති භාහිර පාර්ශවයන් 3 ක් අනුපිළිවෙළන් නම් කර එයට හේතු සඳහන් කරන්න.